පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත
மாகாணக் கல்வித் திணைக்களம் - வட மத்திய மாகாணம்
DEPARTMENT OF EDUCATION – NORTH CENTRAL PROVINCE

ශ්‍රේණිය
12

# අවසාන වාර පරීක්ෂණය - 2019

පාසලේ නම : ..............................................................................................

ශිෂ්‍ය/ශිෂ්‍යාවගේ නම/ ඇතුළත්වීමේ අංකය : .................................................
............................................................................................................ කාලය : පැය 03 මි. 10 යි.

## ඉන්දීය ඉතිහාසය (25A) - I පත්‍රය

**සැලකිය යුතුයි :**

- **මෙම කොටසේ ප්‍රශ්න 40 ක් ඇත. සියලුම ප්‍රශ්නවලට මෙම පත්‍රයේම පිළිතුරු සපයන්න.**
- **එක් එක් ප්‍රශ්නයට ප්‍රතිචාර පහ බැගින් දී ඇති නමුත් නිවැරදි පිළිතුර වන්නේ එකක් පමණි. එම නිවැරදි පිළිතුර තෝරා දී ඇති උපදෙස් පරිදි ලකුණු කරන්න.**
- **මෙම කොටසට ලකුණු 40 ක් දෙනු ලැබේ.**
- **කොටස් දෙකටම මුළු කාලය පැය 03 මි. 10 කි. පිළිතුරු ලියා අවසන් වූ පසු I කොටස, II කොටසේ පිළිතුරුපත් සමඟ අමුණා භාරදෙන්න.**

### I කොටස

- **අංක 01 සිට 10 දක්වා ප්‍රශ්න සඳහා නම් පහ බැගින් දී ඇත. ඉන් එකක් කවර හෝ හේතුවක් නිසා අනෙක් නම් සමඟ නොගැළපේ. එය හඳුනාගෙන නිවැරදි පිළිතුර වරහන් තුළ ලියන්න.**

01. (1) නාසික් (2) කාර්ලේ (3) අජන්තා
(4) එල්ලෝරා (5) මානක්‍ය (................)

02. (1) බ්‍රාහ්මණ (2) ආරණ්‍යක (3) උපනිෂද්
(4) විභාෂා ශාස්ත්‍ර (5) වේදාංග (................)

03. (1) බෝලාන් (2) බැරෝඩා (3) සුලෙයිමාන්
(4) ඛයිබර් (5) මක්‍රාන් (................)

04. (1) කාවේරි (2) ගංගා (3) ක්‍රිෂ්ණා
(4) තුංගභද්‍ර (5) පෙණ්ණාර් (................)

05. (1) වසන්ත් සින්දේ (2) ආර්. ඩී. බැනර්ජි (3) මෝටිමර් විලර්
(4) ස්ටුවට් පිගොට් (5) ඇලෙක්සෙන්ඩර් කනිං හැම් (................)

06. (1) දොලවීර (2) කෞෂාම්බි (3) චුන්හුදාරෝ
(4) හරප්පා (5) කලිබන්ගන් (................)

Education NCP - www.edncp.lk

07. (1) භාරත වර්ෂ (2) භාරත දේශ (3) ජම්බුද්වීප
(4) හින්දුස්ථාන් (5) සප්ත සින්දු (................)

08. (1) තුර්වාස (2) අදේවසු (3) අනාෂාහ්
(4) අකර්මන් (5) කාෂාණවර්ණහ් (................)

09. (1) අස්මක (2) ලිච්ඡවි (3) අවන්ති
(4) ගාන්ධාර (5) කාම්භෝජ (................)

10. (1) බිම්බිසාර (2) උදයන (3) ධනනන්ද
(4) චන්ඩපජ්ජෝත (5) ප්‍රසෙන්ජි කෝසල (................)

- **අංක 11 සිට 15 දක්වා ප්‍රශ්නවල පද යුගල පහ බැගින් දී ඇත. එහෙත් ඒවා අතරින් එක් යුගලයක පද එකිනෙකට නොගැළපේ. එම යුගලය හඳුනාගෙන ඊට අදාළ අංකය වරහන තුළ ලියන්න.**

11. (1) ගිරිනාර් ලිපිය - රුද්‍රදාමන්
(2) හත්ථිගුම්බා ලිපිය - ඛාරවේල
(3) අයිහෝල් ලිපිය - දෙවන චන්ද්‍රගුප්ත
(4) රුම්මින්දෙයි ලිපිය - අශෝක
(5) අලහබාද් ප්‍රශස්තිය - සමුද්‍රගුප්ත (................)

12. (1) කෝලිය - රාම ග්‍රාම
(2) මෞර්ය - සරස්වති
(3) ලිච්ඡවි - වෛශාලි
(4) විදේහ - මිථිලා
(5) මල්ල - කුසිනාරා (................)

13. (1) කෞටිල්‍යය - අර්ථ ශාස්ත්‍රය
(2) මෙගස්තිනීස් - ඉන්ඩිකා
(3) කාලිදාස - මෘච්ඡකටිකා
(4) හර්ෂවර්ධන - රත්නාවලි
(5) වාල්මීකි - රාමායනය (................)

14. (1) සම්රාට් - පෙරදිග රජවරු
(2) භෝජ - දකුණේ රජවරු
(3) විරාට් - උතුරේ රජවරු
(4) භාගදුග - වයඹ රජවරු
(5) රාජන් - මධ්‍යම ප්‍රදේශයේ රජවරු (................)

Education NCP - www.edncp.lk

15. (1) පූර්ණ කස්සප - අකිරිය වාදය
(2) මක්කලි ගෝසාල - නියති වාදය
(3) අජිතකේස කම්බල - භෞතික වාදය
(4) සංජය බෙල්ලට්ඨිපුත්ත - අමරාවික්ඛෙප වාදය
(5) පකුධ කච්චායන - පරම අවිහිංසා වාදය (................)

- **අංක 16 සිට 20 තෙක් එක් එක් ප්‍රශ්නයෙහි දී ඇති නාම / ප්‍රකාශන දින වකවානු X තීරුවේ දී ඇති ඒවා සමඟ කිසියම් ආකාරයකට ගැලපේ. එහෙත් ඒවා දී ඇත්තේ ගැළපෙන අනුපිළිවෙලට නොවේ. Y තීරුව X තීරුව සමඟ ගැළපෙන අනුපිළිවෙල සකස් කළ විට පහත දී ඇති සංයෝග පහෙන් එකක් නිවැරදි ය. එම නිවැරදි සංයෝගයට අයත් අංකය වරහන තුළ ලියන්න.**

16.

| X | | Y | |
|---|---|---|---|
| 1. | කාලිදාස | A | බුද්ධ චරිතය |
| 2. | වරහමිහිර | B | සාකුන්තලය |
| 3. | දණ්ඩින් | C | දසකුමාර චරිතය |
| 4. | භාරවි | D | කිරාතාර්ජුනිය |
| 5. | අශ්වඝෝෂ | E | බෘහද්සංහිතා |

(1) BECDA (2) BEDCA (3) EDBAC
(4) ABDCE (5) DCEAB (................)

17.

| X | | Y | |
|---|---|---|---|
| 1. | ඉන්ද්‍ර ප්‍රස්ථය | A | ගංගා |
| 2. | කනෞජ් | B | ගෝධාවාරි |
| 3. | භාරුකච්ඡ | C | යමුනා |
| 4. | අමරාවති | D | කෘෂ්ණා |
| 5. | ප්‍රතිෂ්ඨාන | E | නර්මදා |

(1) ADCBE (2) BEDCA (3) CAEDB
(4) CBAED (5) ECBAD (................)

18.

| X | | Y | |
|---|---|---|---|
| 1. | ඉන්ද්‍ර දෙවි | A | වැස්සට අධිපති |
| 2. | වරුණ දෙවි | B | උදෑසනට අධිපති |
| 3. | අග්නි දෙවි | C | ගින්නට අධිපති |
| 4. | ඌෂා දෙවි | D | යුද්ධයට අධිපති |
| 5. | යම දෙවි | E | මරණයට අධිපති |

(1) ABDCE (2) DACBE (3) EDBCA
(4) ACBED (5) DBCAE (................)

Education NCP - www.edncp.lk

19.

| | X | | Y |
|---|---|---|---|
| 1. | ශ්‍රැති | A | වේදය |
| 2. | සෝම | B | වැන්දඹු බිරිඳ ඉටු කළ චාරිත්‍රය |
| 3. | සභා | C | වැඩිහිටියන්ගේ රැස්වීම |
| 4. | සති | D | මත්පැන් වර්ගයක් |
| 5. | පණි | E | අනාර්ය ගෝත්‍රයක් |

(1) BEDCA (2) CAEDB (3) DBAEC
(4) ADCBE (5) ECBAD (................)

20.

| | X | | Y |
|---|---|---|---|
| 1. | සුශ්‍රැත | A | නිදහස |
| 2. | ආචති | B | සතුන් ඝාතනයෙන් වැළකීම |
| 3. | සම්ප්‍රතිපත්ති | C | කීකරු බව |
| 4. | දාන | D | ගරුත්වය |
| 5. | ප්‍රණානාම් අනාරම්භ | E | නිරවද්‍ය සංග්‍රහය |

(1) CEDBA (2) CDAEB (3) CADEB
(4) CBDAE (5) CDEAB (................)

- **අංක 21 සිට 25 තෙක් සෑම ප්‍රශ්නයකට ම නිවැරදි පිළිතුර තෝරා එහි අංකය වරහන තුළ ලියන්න.**

21. ක්‍රි. ව. පළමුවන සියවසේ සංගම් සාහිත්‍යයේ පළමු කොටස රචනා වූ නගරය නම් කරන්න.
(1) තාංජෝර් (2) කාංචිය (3) තෙන්මදුරෙයි
(4) කඩාරම්පුරම් (5) මධුරෙයි (................)

22. ඉන්දියාවට පිවිසීමේ දී වයඹ දිග දුර්ග මාර්ගවලින් වැඩිම පිරිසක් භාවිතා කළ මාර්ගය,
(1) ඛයිබර් (2) බෝලාන් (3) මක්‍රාන්
(4) බැරෝඩා (5) හේරාත් (................)

23. ඉන්දු නිම්නයේ වාණිජ නගරය වූ රබිසාර් පෝෂණය වන ගංගාව නම් කරන්න.
(1) රාවි නදිය (2) බියස් නදිය (3) සත්ලේජ
(4) ගග්ගර් නදිය (5) සින්දු නදිය (................)

24. ඉන්දු ආර්ය සංක්‍රමණ ගැන සඳහන් වන විදේශීය සෙල්ලිපිය,
(1) දිල්ලි තෝප්‍රා (2) කාල්සි (3) මැන්ඩසෝර්
(4) කන්දහාර් (5) බෝසස්කෝයි (................)

25. පියරජතුමා මිය යන විට අශෝක යුවරජු ලෙස කටයුතු කළේ කුමන නගරයේ දැයි නම් කරන්න.
(1) තක්ෂිලා (2) උජ්ජයිනි (3) තෝසලි
(4) සුවණ්ණගිරි (5) කාලිංගය (................)

Education NCP - www.edncp.lk

- **අංක 26 සිට 30 තෙක් සෑම ප්‍රශ්නයකටම එක් මාතෘකාවක් යටතේ කරුණු පහ බැගින් දී ඇත. එම කරුණු අතරින් එකක් අදාළ මාතෘකාවට නොගැළපේ. එය හඳුනාගෙන ඊට අදාළ අංකය වරහන තුළ ලියන්න.**

26. පැරණි කාසි,
   (1) ලෝහයෙන් තනා ඇති කාසිවල විවිධ සංකේත ඇත.
   (2) හස් එබූ කාසි කහාපන නමින් හැඳින්වේ.
   (3) මෞර්ය චන්ද්‍ර ගුප්ත ගැන දීර්ඝ විස්තර කාසිවල ඇත.
   (4) කණිෂ්ක රජු විසින් රන් කාසි නිකුත් කර ඇත.
   (5) පැරණි තාක්ෂණය ගැන ද තොරතුරු ලැබේ. (................)

27. පශ්චාත් වෛදික යුගය,
   (1) වර්ණ ක්‍රමය පෙරට වඩා දැඩි විය.
   (2) අධ්‍යාපනය බ්‍රහ්මණ ක්ෂත්‍රිය වෛශ්‍යයන්ට සීමා විය.
   (3) වෛදික යුගයට වඩා මෙකළ කාන්තාවට අඩු ගෞරවයක් හිමි විය.
   (4) වේදය ඉගැන්වීම බ්‍රහ්මණයන් හා වෛශ්‍යයන් සිදුකරන ලදී.
   (5) බ්‍රාහ්මණයාගේ ජීවිතය ආශ්‍රම හතරකට බෙදන ලදී. (................)

28. රඛිගාර් නගරය,
   (1) වත්මන් ඉන්දියාවේ හර්යානාවල පිහිට ඇත.
   (2) මෙහි මහාචාර්ය වසන්ද් සින්දේ විසින් කැණීම් කර තිබේ.
   (3) හරප්පා සභ්‍යත්වයේ කාර්මික නගරය බව සොයා ගන්නා ලදී.
   (4) මෙම නගරය හෙක්ටයාර් 350 පමණ විශාල භූමි ප්‍රමාණයක විහිද පවතී.
   (5) රඛිගාර්වල දියුණුව ගොඩබිම් වරාය පිහිටා ඇත. (................)

29. ක්‍රි. පූ. හයවන සියවසේ ගණ රාජ්‍යය,
   (1) මෙහි රාජ්‍ය නායකයා අධිරාජ්‍යයා ලෙසින් හැඳින්වේ.
   (2) අධිකරණය හා පරිපාලන කටයුතු මෙහෙයවන ලද්දේ සභාව විසිනි.
   (3) සභාවක් පැවැත්වීමට ගණ පූර්ණය අවශ්‍ය වේ.
   (4) තීරණය ගනු ලැබුවේ බහුතර ඡන්දයෙනි.
   (5) පවේණි පුස්තකය අනුව දඬුවම් නියම කරන ලදී. (................)

30. මෞර්ය අධිරාජ්‍යයේ වැදගත්කම,
   (1) පැරණි ඉන්දියාවේ විශාලතම අධිරාජ්‍ය බිහි වීම.
   (2) මහජන සුබසාධනය වර්ධනය වීම.
   (3) බෞද්ධ ධර්ම ප්‍රචාරයට දායක වීම.
   (4) ගාන්ධාර කාම්භෝජ වැනි රාජ්‍ය යටත් නොවීම.
   (5) විධිමත් පාලන සංවිධානයක් ගොඩ නංවාලීම. (................)

Education NCP - www.edncp.lk

- **අංක 31 සිට 35 තෙක් එක් එක් ප්‍රශ්නයට දක්වා ඇති ABCD යන ප්‍රතිචාර අතරින් එකක් හෝ කිහිපයක් හෝ නිවැරදි ය. එම නිවැරදි ප්‍රතිචාරය හෝ ප්‍රතිචාර තෝරා,**

| | | |
|---|---|---|
| **A සහ B පමණක් නිවැරදි නම්** | 01 ද | |
| **B සහ C පමණක් නිවැරදි නම්** | 02 ද | |
| **C සහ D පමණක් නිවැරදි නම්** | 03 ද | |
| **A සහ C පමණක් නිවැරදි නම්** | 04 ද | |
| **ප්‍රතිචාර එකක් හෝ දෙකකට වැඩි සංඛ්‍යාවක් නිවැරදි නම්** | 05 ද | **වරහන් තුළ ලියන්න.** |

| **උපදෙස් සම්පිණ්ඩනය** | | | | |
|---|---|---|---|---|
| 1 | 2 | 3 | 4 | 5 |
| **A සහ B පමණක් නිවැරදිය** | **B සහ C පමණක් නිවැරදිය** | **C සහ D පමණක් නිවැරදිය** | **A සහ C පමණක් නිවැරදිය** | **ප්‍රතිචාර එකක් හෝ දෙකකට වැඩි සංඛ්‍යාවක් නිවැරදිය** |

31. සාහිත්‍ය මූලාශ්‍ර,
    (A) පැරණිතම ඉන්දීය සාහිත්‍ය ආගමික ස්වරූපයක් ගනී.
    (B) වෛදික සාහිත්‍යය බොහෝ ඓතිහාසික කරුණු සපයයි.
    (C) කල්හානගේ රාජතරංගනියේ කාශ්මීර ඉතිහාසය සඳහන් වේ.
    (D) හෙරඩෝටස් ඉන්දියාව ගැන ලියූ පළමු ග්‍රීක ජාතිකයා ය. (................)

32. ඉන්දියාවේ භූගෝලීය ලක්ෂණ,
    (A) සත්ලේජ ගංගා නදියේ අතු ගංගාවකි.
    (B) නර්මදා නදිය පැහැදිලි දේශ සීමාවකි.
    (C) ගංගා යමුනා තැනිතලාව විශාල අධිරාජ්‍යවල මධ්‍යස්ථානය විය.
    (D) මක්‍රාන් දුර්ගය ඉන්දියාවට පිවිසීමේ පහසුව මාර්ගය විය. (................)

33. ජෛනාගම,
    (A) ජෛනාගම ආරම්භ කරන ලද්දේ සංජය බෙල්ලට්ටි පුත්ත ය.
    (B) ජෛන ආගමිකයෝ දෙවියන් විශ්වාස කළහ.
    (C) දිගාම්බර හා ස්වේතාම්බර නිකාය දෙකකට බෙදුනි.
    (D) ජෛනයෝ වර්ණ ක්‍රමය හෝ යාග විශ්වාස නොකළහ. (................)

34. බිම්බිසාර රජු,
    (A) බිම්බිසාර රජු පාඨලි පුත්‍රය මගධයේ අගනුවර කරවීය.
    (B) බිම්බිසාර රජු හර්යංක වංශිකයෙකි.
    (C) ඔහු ශ්‍රේණිය (සේනිය) විරුදයෙන් හැඳින්වීය.
    (D) මෙම රජු රාජ්‍ය වර්ධනය කරගත්තේ යුධබලයෙන් පමණි. (................)

Education NCP - www.edncp.lk

35. නන්ද රාජවංසය,

(A) හර්යංක වංශයෙන් පසු නන්දයෝ බලයට පත් වූහ.

(B) පුරාණ ග්‍රන්ථවලට අනුව එහි ආරම්භකයා මහා පද්මනන්ද රජු ය.

(C) මහා පද්ම නන්දගෙන් පසු ඔහුගේ පුතුන් නවදෙනෙක් බලයට පත් වූහ.

(D) ධනනන්දගෙන් පසු මගධයේ නන්ද බලය අවසන් විය. (................)

- **අංක 36 සිට 40 ප්‍රශ්නවලට අදාළව ප්‍රකාශ දෙක බැගින් දී ඇත. එක් එක් ප්‍රශ්නය සම්බන්ධයෙන් දී ඇති ප්‍රකාශ යුගලයට හොඳින්ම ගැළපෙනුයේ පහත වගුවෙහි දැක්වෙන 1, 2, 3, 4 සහ 5 යන කවර ප්‍රකාශ යුගලය දැයි තෝරා ඊට අදාළ අංකය වරහන තුළ ලියන්න.**

| | **පළමුවැනි ප්‍රකාශය** | **දෙවැනි ප්‍රකාශය** |
|---|---|---|
| 1 | **නිවැරදි ය.** | **වැරදි ය.** |
| 2 | **නිවැරදි ය.** | **නිවැරදි ය.** |
| 3 | **වැරදි ය.** | **වැරදි ය.** |
| 4 | **වැරදි ය.** | **නිවැරදි ය.** |
| 5 | **නිවැරදි ය.** | **නිවැරදි වන අතර පළමුවැන්න මැනවින් පහදා දෙයි.** |

| | **පළමුවැනි ප්‍රකාශය** | **දෙවැනි ප්‍රකාශය** | |
|---|---|---|---|
| 36. | අංගුත්තර නිකායට අනුව ක්‍රි. පූ. 6 වන සියවසේ ජනපද 16 විය. | එම ජනපද අතර පවා හි මල්ල රජදරුවෝ කීර්තියක් ඉසිලූහ. | (............) |
| 37. | ඩෙකානයේ බටහිර සාට්ස් කඳුවැටිය මිනිස් වාසයක් බිහි වීම අවහිර කළහ. | එහෙත් නැගෙනහිර සාට්ද් කඳු රාජවංස ගණනාවකට ජනාවාස විය. | (............) |
| 38. | සිසුනාග රජවරු අශෝකගෙන් පසු මගධයේ බලය ගොඩ නැගූහ. | දෙවන ධර්ම සංගායනාවට අනුග්‍රහ කරන ලද්දේ කාලාශෝක රජු විසින් ය. | (............) |
| 39. | ඉන්දු නිම්නයේ බිඳවැටීම ගැන අදහස් කීපයක්ම පවතී. | එම බිඳවැටීම බාහිර ආක්‍රමණයක් බව හමු වී ඇති අක්‍රමවත් ඇටසැකිලි දියුණු ආයුධවල ශේෂ කොටස් වලින් සනාථ වේ. | (............) |
| 40. | අශෝක රජුගේ ධර්මදූත සේවාව සෙල්ලිපිවල සඳහන් කරයි. | මිහිඳු හිමි ඇතුළු පිරිස ලංකාවට පැමිණි බව අශෝක සෙල්ලිපිවල දැක්වේ. | (............) |

***

Education NCP - www.edncp.lk

# ඉන්දීය ඉතිහාසය (25A) - II පත්‍රය

## II කොටස

**සැලකිය යුතුයි :**

- **පළමු වන ප්‍රශ්නය අනිවාර්ය වේ.**
- **B හා C කොටස් වලින් අවම වශයෙන් ප්‍රශ්න එක බැගින් තෝරා ගෙන ප්‍රශ්න තුනකට පිළිතුරු සපයන්න.**

## A කොටස

01. ඔබට සපයා ඇති ඉන්දීය සිතියමේ පහත සඳහන් සියලුම ස්ථාන ලකුණු කොට නම් කරන්න.

| | | | | | |
|---|---|---|---|---|---|
| (i) | හින්දුකුෂ් කඳු | (ii) | මක්‍රාන් දුර්ගය | (iii) | රබිගාර් |
| (iv) | ගෝදාවාරී ගඟ | (v) | සාංචි ස්ථූපය | (vi) | ඉන්දු ප්‍රස්තය |
| (vii) | සෞරාට්‍රය | (viii) | පාඨලී පුත්‍රය | (ix) | තාම්‍ර ලිප්ති වරාය |
| (x) | කාවේරි පටුන | (xi) | කාලිංගය | (xii) | භාරුකච්ඡ වරාය |

(ලකුණු 12)

## B කොටස

02. වයඹ දිග දුර්ග මාර්ග ඉන්දීය ඉතිහාසයට කළ බලපෑම විස්තර කරන්න. (ලකුණු 16)

03. (i) ඉන්දු නිම්නයේ වාසය කළ ජන වර්ග දෙකක් නම් කරන්න. (ලකුණු 02)
(ii) ඉන්දු නිම්න ශිෂ්ටාචාරයේ ආරම්භය ගැන ඇති අදහස් විමර්ශනය කරන්න. (ලකුණු 05)
(iii) මෙම ශිෂ්ටාචාරයේ බිඳවැටීම පිළිබඳ ඇති අදහස් විවේචනාත්මකව පරීක්ෂා කරන්න. (ලකුණු 09)

04. සාග් වෛදික යුගයේ ආගම හා සමාජය පශ්චාත් වෛදික යුගයේ වෙනස් වී ගිය ආකාරය විස්තර කරන්න. (ලකුණු 16)

05. පහත දැක්වෙන මාතෘකා ඇසුරෙන් ඕනෑම දෙකක ඓතිහාසික වැදගත්කම පිළිබඳව සටහන් ලියන්න.

| | | | |
|---|---|---|---|
| i. | ගංගා යමුනා තැනි තලාව | ii. | ඉන්දු නිම්නයේ ආගම |
| iii. | චතුර් වර්ණාශ්‍රම ධර්ම | iv. | පශ්චාත් වෛදික යුගයේ දේශපාලනය |

(ලකුණු 16)

Education NCP - www.edncp.lk

## C කොටස

06. ක්‍රි. පූ. හයවන සියවසේ පැවති දේශපාලන ක්‍රමය කෙසේ දැයි විස්තර කරන්න. (ලකුණු 16)


07. i. මගධ රාජ්‍යයේ පාලන මධ්‍යස්ථානය නම් කරන්න. (ලකුණු 01)
    ii. මගධ රාජ්‍යයේ වර්ධනයට බිම්බිසාර රජුගෙන් වූ සේවාව විස්තර කරන්න. (ලකුණු 07)
    iii. චන්ද්‍ර ගුප්ත මෞර්ය රජු මගධ රාජ්‍යයට කළ සේවය සැකෙවින් විස්තර කරන්න. (ලකුණු 08)

08. "අශෝක අධිරාජ්‍යයා මෞර්යයේ සිටි ශ්‍රේෂ්ඨතම පාලකයාය." මෙම ප්‍රකාශය විමසන්න. (ලකුණු 16)

09. පහත සඳහන් මාතෘකා ඇසුරෙන් ඕනෑම දෙකක ඓතිහාසික වැදගත්කම ගැන සටහන් ලියන්න.
    (i) ෂඩ් ශාස්තෘවරු
    (ii) නන්ද - රාජ්‍යවංශය
    (iii) ගණ රාජ්‍යය
    (iv) මෞර්යයයේ බිඳ වැටීම (ලකුණු 8 + 8 = 16)

***

Education NCP - www.edncp.lk




Education NCP - www.edncp.lk

පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත
மாகாணக் கல்வித் திணைக்களம் - வட மத்திய மாகாணம்
DEPARTMENT OF EDUCATION – NORTH CENTRAL PROVINCE

ශ්‍රේණිය
12

අවසාන වාර පරීක්ෂණය - 2017

පාසලේ නම : ...............................................................................................

ශිෂ්‍ය/ශිෂ්‍යාවගේ නම/ ඇතුළත්වීමේ අංකය : ......................................................
...............................................................................................................

කාලය : පැය 03 යි.

# ඉන්දීය ඉතිහාසය I

**සැලකිය යුතුයි :**

❖ **සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

- **ප්‍රශ්න අංක 01 සිට 10 දක්වා ප්‍රශ්න සඳහා නම් 05 බැගින් දී ඇත. ඒවා අතුරෙන් එකක් කවර හේතුවක් නිසා අනෙක් නම් සමග නොගැළපේ. එම නොගැළපෙන නම හඳුනාගෙන, එහි අංකය වරහන තුළ ලියන්න.**

01. (1) හින්දු කුෂ් (2) සත්පුර (3) ආරවල්ලි
(4) වින්ධ්‍යා (5) ඉහ්රාත් (............)

02. (1) රාවි (2) බියස් (3) ක්‍රිෂ්ණා
(4) සත්ලේජ් (5) ජේලම් (............)

03. (1) රූපාර් (2) ප්‍රයාග් (3) ප්‍රුදෙයි දාරෝ
(4) කුල්ලි (5) කලිවන්ගන් (............)

04. (1) සංහිතා (2) භගවත්ගීතා (3) බ්‍රාහ්මණ
(4) අරණ්‍යක (5) උපනිෂද් (............)

05. (1) චම්පා (2) අස්වක (3) උජ්ජයිනි
(4) කෞෂාම්බි (5) ශ්‍රාවස්ති (............)

06. (1) බිම්බිසාර (2) අජාසත්ත (3) මුණ්ඩක
(4) නාගදාස (5) සිසුනාග (............)

Education NCP - www.edncp.lk

07. (1) පරමාර (2) ඔස්ට්‍රලොයිඩ් (3) මධ්‍යධරණී
(4) මොංගොලොයිඩ් (5) ඇල්ෆයින් (............)

08. (1) ඉන්ද්‍ර (2) මිත්‍ර (3) වරුණ
(4) අග්නි (5) රාව (............)

09. (1) මත්ස්‍ය පුරාණය (2) විෂ්ණු පුරාණය (3) වායු පුරාණය
(4) ස්කන්ධ පුරාණය (5) පෙරිය පුරාණය (............)

10. (1) අශෝක (2) කුණාල (3) පුෂ්‍ය මිත්‍ර
(4) සම්ප්‍රති (5) බෘහද්රථ (............)

- **ප්‍රශ්න අංක 11 සිට 15 තෙක් ප්‍රශ්නවල පද යුගල පහ බැගින් දී ඇත. ඒවා අතරින් එක් යුගලයක පද එකිනෙකට නොගැළපේ. එම නොගැළපෙන යුගලය කුමක්දැයි හඳුනාගෙන, ඊට අදාළ අංකය වරහන තුළ ලියන්න.**

11. (1) සුප්පාරක - තප්ති
(2) බාරාණසි - ගංගා
(3) ඉන්ද්‍රප්‍රස්ත - යමුනා
(4) භාරුකච්ඡ - නර්මදා
(5) ප්‍රතිෂ්ඨාන - ගෝධාවාරි (............)

12. (1) බිම්බිසාර - මගධය
(2) ප්‍රසේනජිත් - කෝසලය
(3) චණ්ඩපජ්ජෝත - උජ්ජයිනි
(4) විඩූඪභ - පංචාල
(5) බ්‍රහ්මදත්ත - කාසි (............)

13. (1) කෝලිය - රාමග්‍රාම
(2) මෝරිය - පිප්පලිවනය
(3) ලිච්ඡවී - වෛශාලි
(4) විදේහ - මිථිලා
(5) බුලීහු - සරස්වතී (............)

Education NCP - www.edncp.lk

14. (1) ටොලමි - ග්‍රීක

(2) ප්ලිනි - පර්සියන්

(3) තාරානාත් - ටිබෙට්

(4) අල්බීරූනි - අරාබි

(5) හියුං සාං - චීන (...........)

15. (1) වේද - ඍග්වේදය

(2) බ්‍රාහ්මණ - ඓතරේය

(3) පුරාණ - මත්ස්‍ය

(4) උපනිෂද් - චාන්දෝග්‍ය

(5) ජෛන - අර්ථ ශාස්ත්‍රය (...........)

- **ප්‍රශ්න අංක 16 සිට 20 තෙක් එක් එක් ප්‍රශ්නයෙහි නාම / ප්‍රකාශන / දින වකවානු සමූහයක් X සහ Y තීරුවල දී ඇත. Y තීරුවේ දී ඇති නාම / ප්‍රකාශන / දින වකවානු X තීරුවේ ඒවා සමඟ කිසියම් ආකාරයකට ගැළපේ. එහෙත් ඒවා දක්වා ඇත්තේ ගැළපෙන අනුපිළිවෙළට නොවේ. Y තීරුව X තීරුව සමඟ ගැළපෙන අනුපිළිවෙළ සකස් කළ විට පහත ඇති සංයෝග පහෙන් එකක් නිවැරදි ය. නිවැරදි සංයෝගයට අයත් අංකය තෝරා වරහන තුළ ලියන්න.**

16.

| X | | Y | |
|---|---|---|---|
| (i) | කුල | A | පවුල |
| (ii) | සෝම | B | පැරණි ඉන්දීය කාසි වර්ගයක් |
| (iii) | පූර් | C | ශුද්ධ වූ පානයක් |
| (iv) | සති | D | වැන්දඹු බිරිඳ ස්වාමියාට දැක් වූ චාරිත්‍රය |
| (v) | නිෂ්ක | E | බලකොටු නරගයක් |

(1) ACEDB (2) BCDEA (3) ABCDE

(4) DEABC (5) EBCDA (...........)

Education NCP - www.edncp.lk

17.

| | X | | Y |
|---|---|---|---|
| (i) | ඉන්ද්‍ර | A | කුණාටුවට අධිපති |
| (ii) | කුවේර | B | වරණයට අධිපති |
| (iii) | වරුණ | C | යුද්ධයට අධිපති |
| (iv) | යම | D | අරුතට අධිපති |
| (v) | මාරුත් | E | ධනයට අධිපති |

(1) CABDE (2) CEDAB (3) ACBED

(4) BADCE (5) EBDCA (............)

18.

| | X | | Y |
|---|---|---|---|
| (i) | චතුරාර්ය සත්‍යය | A | දුක්ඛ, සමුදය ,නිරෝධ, මාර්ග |
| (ii) | චතුර්වේද | B | සාම, දාන, භේද, දණ්ඩ |
| (iii) | චතුර් ආශ්‍රම ධර්ම | C | බ්‍රාහ්මණ, ක්‍ෂත්‍රිය, වෛශ්‍ය, ශුද්‍ර |
| (iv) | චතුර්වර්ණ | D | ඍග්, සජුර්, සාම, අථර්වන් |
| (v) | චතුර් උපාය මාර්ග | E | බ්‍රාහ්මණ, ගෘහස්ථ, වානප්‍රස්ථ, සන්‍යාසි |

(1) ABCDE (2) AEBCD (3) ADCBE

(4) ADECB (5) ACBDE (............)

19.

| | X | | Y |
|---|---|---|---|
| (i) | මහා රක්ෂිත හිමි | A | යවන දේශය |
| (ii) | මජ්ජිව හිමි | B | මහා රාෂ්ට්‍රය |
| (iii) | රක්ෂිත හිමි | C | හිමවන්ත දේශය |
| (iv) | මහා ධර්ම රක්ෂිත හිමි | D | අපරාන්තය |
| (v) | ධර්ම රක්ෂිත හිමි | E | වන වාසය |

(1) ACEBD (2) DACEB (3) EACDB

(4) DACBE (5) BECDA (............)

Education NCP - www.edncp.lk

20.

| | X | | Y |
|---|---|---|---|
| (i) | කාලිදාස | A | කාව්‍යාදර්ශය |
| (ii) | හර්ෂවර්ධන | B | රාමායනය |
| (iii) | වාර්ල්මිකි | C | කුමාර සම්භවය |
| (iv) | කල්හාන | D | රත්නාවලි |
| (v) | දන්ඩින් | E | රාජතරංගනී |

| | | |
|---|---|---|
| (1) CBADE | (2) CDBEA | (3) CADEB |
| (4) CEABD | (5) CAEDB | (............) |

- **ප්‍රශ්න අංක 21 සිට 25 තෙක් සෑම ප්‍රශ්නයකට ම නිවැරදි පිළිතුර තෝරා එහි අංකය වරහන තුළ ලියන්න.**

21. මහා නාන තටාකයේ නටබුන් දක්නට ලැබෙන්නේ කුමන ඉන්දු නිම්න නගරයේ ද?

| | | |
|---|---|---|
| (1) කලිබන්ගන් | (2) රූපාර් | (3) හරප්පා |
| (4) ලෝතාල් | (5) මොහෙන්දොජාරෝ | (............) |

22. ඉන්දු ආර්යයන්ගේ නිජබිම් සංකල්පය ගැන අධ්‍යයනයේ දී වැදගත්වන ඓතිහාසික ලේඛනය කුමක් ද?

| | | |
|---|---|---|
| (1) රුවින්දෙයි ලේඛනය | (2) හත්තිගුම්බා ලේඛනය | (3) බෝ-ඝස්කෝයි ලේඛනය |
| (4) ජුනාගාන් ලේඛනය | (5) මල්ලිකාර්ජුන කෝවිල් ලිපිය | (............) |

23. භාරුකච්ච වරායෙන් මුහුදට ගලා බස්නා ගංගාව කුමක් ද?

| | | |
|---|---|---|
| (1) නර්මදා | (2) තප්ති | (3) කාවේරි |
| (4) ක්‍රිෂ්ණා | (5) මහා නදී | (............) |

24. මහායාන ධර්මයේ පිටක වැඩිම සංඛ්‍යාවක් ග්‍රන්ථාරූඪ කරන ලද්දේ කුමන භාෂාවෙන් ද?

| | | |
|---|---|---|
| (1) ප්‍රාකෘත | (2) පාලි | (3) බ්‍රාහ්මී |
| (4) සංස්කෘත | (5) ඛරෝෂ්ඨී | (............) |

25. චන්ද්‍ර ගුප්ත මෞර්ය රජු පරාජය කළ වයඹ දිග සිටි ග්‍රීක රජු කවරෙක් ද?

| | | |
|---|---|---|
| (1) මහා ඇලෙක්සෙන්ඩර් | (2) තියෝඩෝටර් | (3) මෙගස්තිනිස් |
| (4) සෙලියුකස්නිකේටර් | (5) මිනැන්ඩර් | (............) |

Education NCP - www.edncp.lk

- **ප්‍රශ්න අංක 26 සිට 30 තෙක් සෑම ප්‍රශ්නයකටම එක් මාතෘකාවක් යටතේ කරුණු පහ බැගින් සපයා ඇත. එම කරුණු අතුරෙන් එකක් අදාළ මාතෘකාවට නොගැළපේ. එය තෝරා, අංකය වරහන තුළ ලියන්න.**

26. පැරණි ඉන්දියානු ඉතිහාසය ගොඩ නැගීමේ දී සෙල්ලිපිවල වැදගත්කම,
    (1) කාල නිර්ණය කිරීමට උපකාරී වේ.
    (2) එකල ලේඛන ක්‍රමවේද පිළිබඳ අදහසක් සපයයි.
    (3) රාජධානිවල බල ව්‍යාප්තිය පිළිබඳ හඳුනාගැනීමට හැකි වේ.
    (4) සෙල්ලිපිවල නිතරම සත්‍ය හා නිවැරදි තොරතුරු සඳහන් වේ.
    (5) වැදගත් සමහර ස්ථාන හඳුනාගැනීමට (............)

27. හරප්පා නගරය,
    (1) නගරය ඉදිකරන ලද්දේ සැලසුමකට අනුවය.
    (2) විශාල ගොඩනැගිලි ගොඩ නංවා ඇත්තේ වටකුරු කුලුණු සහිතමය.
    (3) හරප්පා හා මොහොන්ජෝ-දාරෝ නගර සැලසුම්වල සමානකම් ඇත.
    (4) වීදි අතර මීටර් 4 සිට 10 දක්වා පළල් ව පවතී.
    (5) නගරයේ කාර්යක්ෂම සෞඛ්‍යාරක්ෂක ක්‍රමයක් දක්නට ලැබේ. (............)

28. ඍග් වෛදික යුගය,
    (1) මෙම අවධියේ ප්‍රධාන දෙවිවරු වූයේ අග්නි, ඉන්ද්‍ර සහ වරුණ ය.
    (2) සමාජය ගෝත්‍රික තත්ත්වයේ පැවතිණි.
    (3) ඍග් වෛදික වැසියන්ගේ ප්‍රධාන ජීවනෝපාය කෘෂිකර්මය විය.
    (4) මෙම අවධියේ ගවයා ප්‍රධාන ආර්ථික සාධකයක් විය.
    (5) මගධය අධිරාජ්‍යයක් ව පැවතීම මෙකල දක්නට ලැබෙන ප්‍රධාන සාධකයක් විය. (............)

29. පශ්චාත් වෛදික යුගය,
    (1) වර්ණ ක්‍රමය පෙර අවධියට වඩා දැඩි විය.
    (2) වෛදික යුගයට වඩා කාන්තාවට ගෞරවය අඩු විය.
    (3) අධ්‍යාපනය බ්‍රාහ්මණ, ක්ෂත්‍රිය, වෛශ්‍ය වර්ණයන්ට සීමා විය.
    (4) වේදය උගැන්වීමට අවසරය වූයේ බ්‍රාහ්මණ වංශිකයන්ට ය.
    (5) වෛශ්‍යයන්ගේ ප්‍රධාන කාර්ය වූයේ රට ආරක්ෂා කිරීම හා රාජ්‍ය පාලනයයි. (............)

Education NCP - www.edncp.lk

30. මෞර්ය අධිරාජ්‍යයේ පිරිහීම හා බිඳ වැටීමට හේතු වූ සාධක,

(1) අශෝක ධර්මයට විරුද්ධ ව ඇති වූ බ්‍රාහ්මණ විරෝධය

(2) වයඹ දිගින් වූ කුෂාණ හා ග්‍රීක ආක්‍රමණ

(3) හූණ ආක්‍රමණවල බලපෑම

(4) දුර්වල රාජ්‍ය අනුප්‍රාප්තිය

(5) ප්‍රත්‍යන්ත බල ප්‍රදේශ ස්වාධීනත්වය පළ කිරීම (...........)

- **ප්‍රශ්න අංක 31 සිට 35 තෙක් ඇති ප්‍රශ්නවලට දක්වා ඇති (A) (B) (C) සහ (D) යන ප්‍රතිචාර හතර අතරින් එකක් හෝ කිහිපයක් හෝ නිවැරදි ය. නිවැරදි ප්‍රතිචාරය හෝ ප්‍රතිචාර හෝ තෝරා,**

| | |
|---|---|
| **(A) සහ (B) පමණක් නිවැරදි නම්** | **1 ද** |
| **(B) සහ (C) පමණක් නිවැරදි නම්** | **2 ද** |
| **(C) සහ (D) පමණක් නිවැරදි නම්** | **3 ද** |
| **(A) සහ (C) පමණක් නිවැරදි නම්** | **4 ද** |
| **ප්‍රතිචාර එකක් හෝ දෙකකට වැඩි සංඛ්‍යාවක් හෝ නිවැරදි නම්** | **5 ද** |

**වරහන් තුළ ලියන්න.**

| **උපදෙස් සම්පිණ්ඩනය** | | | | |
|---|---|---|---|---|
| **1** | **2** | **3** | **4** | **5** |
| **(A) සහ (B) පමණක් නිවැරදිය** | **(B) සහ (C) පමණක් නිවැරදිය** | **(C) සහ (D) පමණක් නිවැරදිය** | **(A) සහ (C) පමණක් නිවැරදිය** | **ප්‍රතිචාර එකක් හෝ දෙකකට වැඩි සංඛ්‍යාවක් නිවැරදිය** |

31. සින්දු ගංගා මිටියාවක,

(A) මෙම කලාපයන් තුළ අධිරාජ්‍ය පිහිටුවීමෙහිලා සාරවත් බව හේතු විය.

(B) ප්‍රදේශයේ සශ්‍රීකත්වය විදේශ ආක්‍රමණවලට පසුබිම විය.

(C) දුර්වල රාජ්‍ය පාලන අවධීන්වල මෙම ප්‍රදේශ විදේශ ආක්‍රමණවලට නතු විය.

(D) සශ්‍රීකත්වය වැසියන්ට දාර්ශනික සංකල්පනාවලට ඉඩ සැලසීමය. (...........)

Education NCP - www.edncp.lk

32. මුල් වෛදික ආර්යයන්ගෙන් ඉන්දු නිම්න වැසියන් වෙනස්වන්නේ,

(A) වෛදික සභ්‍යත්වය ග්‍රාමීය වන අතර ඉන්දු නිම්නය නාගරික ය.

(B) වෛදික වැසියන් කෘෂිකර්මාන්තය ජීවිකාව කරගත් අතර ඉන්දු නිම්න වැසියන් එඬේරයන් විය.

(C) වෛදික සභ්‍යත්වය පිතෘ මූලික වූ අතර ඉන්දු නිම්නය මාතෘ මූලික ය.

(D) ඉන්දු නිම්න වැසියන් නිර්මාංශ වූ අතර වෛදික ආර්යයන් මාංශ භක්ෂකයින් විය. (............)

33. ග්‍රීක ලේඛකයෝ,

(A) හෙරඩෝටස්ගේ "හිස්ටරි" කෘතියේ වයඹ දිග ඉන්දියාවේ දේශපාලනය ගැන සඳහන් වේ.

(B) මහා ඇලෙක්සෙන්ඩර් ඉන්දීය ආක්‍රමණය මඟදී නතර කරන ලදී.

(C) මෙගස්තිනිස්ගේ ඉන්ඩිකා කෘතිය මෞර්ය ඉන්දියාව ගැන සඳහන් කරයි.

(D) සෙලියුකස් නිකේටර් මෞර්ය චන්ද්‍ර ගුප්තගේ බලය පිළිගන්නා ලදී. (............)

34. මගධ රාජ්‍යයේ බල වර්ධනය,

(A) බිම්බිසාර හා අජාසත්ත රජවරුන්ගේ යුදමය ප්‍රතිපත්තිය

(B) මගධයේ රජවරුන්ගේ විවාහ ප්‍රතිපත්තිය

(C) මගධය හා ඝණ රාජ්‍ය අතර වූ මිත්‍රශීලී ප්‍රතිපත්තිය

(D) දකුණේ රාජ්‍ය සමඟ වූ සහසම්බන්ධය (............)

35. මෞර්ය අශෝක රජු,

(A) අශෝක රජු සාංචි ස්ථූපය ඉදිකිරීමට අනුග්‍රහ කළේ ය.

(B) ජාත්‍යන්තර බෞද්ධ ධර්ම ප්‍රචාරයට අනුග්‍රහ කරන ලදී.

(C) වෙහෙර විහාර ඉදිකළ අතර හින්දු ආගම වර්ධනය කරන ලදී.

(D) මොග්ගලීපුත්ත තිස්ස තෙරුන් අශෝකට බොහෝ කලකට පෙර වැඩ විසූහ (............)

Education NCP - www.edncp.lk

- **ප්‍රශ්න අංක 36 සිට 40 තෙක් ප්‍රශ්නවලට අදාළ ව ප්‍රකාශ දෙක බැගින් දී ඇත. එක් එක් ප්‍රශ්නය සම්බන්ධයෙන් දී ඇති ප්‍රකාශ යුගලයට හොඳින්ම ගැළපෙනුයේ පහත වගුවෙහි දැක්වෙන 1, 2, 3, 4 සහ 5 යන කවර ප්‍රකාශ යුගල දැයි තෝරා, ඊට අදාළ අංකය වරහන තුළ ලියන්න.**

| | පළමුවැනි ප්‍රකාශය | දෙවැනි ප්‍රකාශය |
|---|---|---|
| 1 | නිවැරදි ය | වැරදි ය |
| 2 | නිවැරදි ය | නිවැරදි ය |
| 3 | වැරදි ය | වැරදි ය |
| 4 | වැරදි ය | නිවැරදි ය |
| 5 | නිවැරදි ය | නිවැරදි වන අතර පළමුවැන්න මැනවින් පහදා දෙයි |

| | පළමුවැනි ප්‍රකාශය | දෙවැනි ප්‍රකාශය |
|---|---|---|
| 36. | වේද සාහිත්‍ය පැරණි ම ඉන්දීය මූලාශ්‍ර වන අතර ලංකාවේ මහා වංශය ද මූලාශ්‍රයක් ලෙස යොදා ගනී. | අශෝක ශිලා ලිපි උත්තර භාරතයේ දේශපාලනය පමණක් අනාවරණය කරයි. (............) |
| 37. | හරප්පා සභ්‍යත්වය පුරාම ඒකීයභාවයක් දක්නට ලැබේ. | ඒකීය භාවය ගොඩ නංවන ලද්දේ බලවත් අධිරාජ්‍යයෙකු විසිනි. (............) |
| 38. | පශ්චාත් වෛදික යුගයේ කාන්තාව මහත් ගෞරවයට පාත්‍ර විය. | පශ්චාත් වෛදික කාන්තාව ගෞරවයට පාත්‍ර වූවා පමණක් නොව වේද අධ්‍යයනය, ගීතිකා ගායනයට ඇයට අවස්ථාව විය. (............) |
| 39. | මගධයේ වර්ධනයට පූර්ව මගධ පාලකයෝ මහත් සේවාවක් කළහ. | හර්යංක, සිසුනාග හා නවකන්ද රජවරු මගධයේ සීමාව පුළුල් කළ අතර එහි කූඨ ප්‍රාප්තිය අශෝක රජු අවධියේ සනිටුහන් විය. (............) |
| 40. | අශෝක අවධියේ මහා මාත්‍රවරුගේ කාර්ය වූයේ බුද්ධාගම ප්‍රචාරය කිරීමයි. | ධර්ම මහා මාත්‍රවරුන්ගේ වගකීම වූයේ (අශෝක) ධර්මය ප්‍රචාරය කිරීමයි. (............) |

***

Education NCP - www.ednocp.lk